# නවලිබරල්වාදය සහ එහි මහජන කළමනාකරණයෙහි රාජ්‍යවාදී එළඹුම පිළිබඳ මානව විද්‍යාත්මක විමසුමක්

**මහාචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන්**
ජනමාධ්‍ය අධ්‍යයනාංශය
ශ්‍රී පාලි මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය.
ranjan@spc.cmb.ac.lk / ranjan2007@gmail.com

අපගේ සජීවීත්වය නවලිබරල්වාදී යුගයක (Neoliberal era) වන අතර එය වේගයෙන් පශ්චාද් නවලිබරල්වාදී යුගයක් (Post - neoliberal era) දක්වා අඛණ්ඩව ප්‍රතිසංස්කරණ, ප්‍රති හැඩගැස්වීම්කරණ සහ ප්‍රතිව්‍යුහගතකරණ තුළ ගමන් කරමින් සිටින බව පැහැදිලි ය. මෙම නවලිබරල්වාදී ප්‍රවේශය ආර්ථිකය (Economics), දේශපාලනය (Politics), ජාත්‍යන්තර සබඳතා (International relations), ප්‍රජාතන්ත්‍රවාදය (Democracy), දෘෂ්ටිවාදය (Ideology), පෞද්ගලිකකරණය (Privatization), සංස්කෘතිය (Culture) ආදී වශයෙන් පුලුල් පරාස තුළ විහිදෙමින් සෑම මහද්වීපයකම ජීවත්වන බිලියන ගණනකගේ ජීවිතවලට සහ එහි පවතින තත්වයනට ප්‍රබලව බලපාමින් මානව ජීවිතයෙහි චර්යාත්මක දිශානති වෙනස් කොට ඇති බවත්, එහි ස්වරූප වර්තමානය තුළ අභියෝගයනට ලක්වී ඇති අයුරුත් තහවුරු කර ගත හැකි වේ. එක් පරම්පරාවක ආයු කාලයටත් වඩා අඩු කාලයක් මෙතෙක් සජීවී වී ඇති මෙම නවලිබරල්රවාදී ප්‍රවේශය වේගයෙන් සමාජයෙහි බුද්ධිමය, සමාජමය සහ භෞතිකවාදී ස්වරූප වෙනස් කරමින් සිටින බවත් පැහැදිලිය.

නවලිබරල්වාදය අධිරාජ්‍යවාදයෙන් සහ ගෝලීයකරණයෙන් (Imperialism and globalization) වෙන් කළ නොහැකි අතර අධිරාජ්‍යවාදය සහ ගෝලීයකරණය යන්න එකිනෙක හා සංයුක්ත ප්‍රබල ක්‍රියාකාරී ප්‍රවේශ වන බව ද පැහැදිලි ය. අද්‍යතනයෙහි ගෝලීයකරණය යන්න ප්‍රබල සංකල්පීය සහ ක්‍රියාකාරී මෙන්ම නොවැළැක්විය හැකි සහ නොසැලකිය හැකි මෙන්ම හිතකර ක්‍රියාවලියක් පමණක් නොව දැඩි තරඟකාරීත්ව ප්‍රවේශ සම්පාදනය කරන සුභසාධනය වැඩිදියුණු කිරීම්වලට සහ ලොව පුරා ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමවේද ශක්තිමත් කිරීමට සහ ව්‍යාප්ත කිරීමට ප්‍රවේශ සම්පාදනය කරන ප්‍රබල ව්‍යාපෘතිකකරණයක් බවට ද ගොඩනැගෙන මත ඉතා ප්‍රබලය. ගෝලීයකරණය ලෙස ලෝකය පුරා සිදුවන චලනයන් සහ හුවමාරු (Movements and exchanges in the world) එනම් මිනිසුන් (Human beings), භාණ්ඩ සහ සේවා (Goods and services), ප්‍රාග්ධනය (Capital), තාක්ෂණය සහ අනෙකුත් සංස්කෘතික භාවිතයන් (Technologies and other cultural practices), වේගවත් කරමින් ලොව පුරා විවිධ ප්‍රදේශ සහ ජනගහනය අතර අන්තර්ක්‍රියා ප්‍රවර්ධනය කිරීම සහ වැඩි කිරීම (Promotes and increases interactions) සඳහා ජාත්‍යන්තර දේශසීමා විවෘත කිරීම පමණක් නොව මෙය පාදකව ජාතික හා ජාත්‍යන්තර ආයතන සහ ප්‍රතිපත්තිවල වෙනස්කම් ගොඩනැගීම (Changes in institutions and policies at national and

international level) ද බලයෙහි සම්ප්‍රේෂණය සහ ව්‍යුහගතවීම් ද ගොඩ නැගෙන ආකාරය ද හඳුනා ගත හැකිය. අධිරාජ්‍යවාදී ගෝලීයකරණය (Imperial globalization) යන්න ද අභිලාෂකාමී බල ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගනු ලබන අතර එය ලෝකයෙහි සෑම රටකම විවිධ සමාජ සහ ආර්ථික දේශපාලන සන්ධාන සහ දේශීය මූල්‍ය සහ මූල්‍ය ආධිපත්‍ය ඒකක සමග අනවරත සබඳතා මේ වන විටත් ගොඩනගා ගෙන ඇති බව ද දැකිය හැකි ය.

නවලිබරල්වාදී සමාජ ප්‍රපංචකරණය (Neoliberal social phenomenon) එහි සමාජ ස්වරූප සමඟින් බටහිර ධනේශ්වර සභාග කේන්ද්‍රීය වූ ව්‍යාපෘතිකකරණය සහ අධිකාරීත්ව ගෝලීයකරණය (Imperial globalism) තවද ප්‍රබලකරමින් සෑම රටකම සමාජ (Social), ආර්ථික (Economic), දේශපාලන සහ අනිකුත් සභාග (Political and other alliances) සමඟ සම්බන්ධ වෙමින් ආර්ථිකය කේන්ද්‍රීය වූ ලෝක බල අධිකාරී ස්වරූපයකට (Economic centered global power hegemony) කේන්ද්‍රගත වන ආකාරය ද පැහැදිලි කොටගත හැකි වේ. මේ අනුව නවලිබරල්වාදයෙහි බහුවිධ එළඹුම් ඇති බව (Multi-level approaches) පැහැදිලි වනවාක් මෙන්ම, එහි ආරම්භය සඳහා එළඹුම් දිගුකාලයක් දක්වා ගමන් කරන බවත්, එම එළඹුම් විවිධ වන බවත්, ඒ පිළිබඳ නිශ්චිත කාල ප්‍රකාශයන් නොමැති බවත් පැහැදිලි ය. මෙම නවලිබරල්වාදයෙහි ප්‍රබල ව්‍යාප්තිය සඳහා බලපෑම නිරන්තර පශ්චාද් යුධ සමයෙහි (Post war era) සමාජ සැලසුම් බිඳවැටීමත් සමඟින්, විශේෂයෙන්ම 1970 වන විට ආර්ථික පොහොසත් රටවල කෙනේසියානු සම්මුතින් බිඳවැටීමත් (Erosion of the Keynesian compromise), 1980 දශකය තුළ සෝවියට් සමූහාණ්ඩුව තුළ එහි බිඳ වැටීමට (Meltdown of the Soviet bloc) අදාළ කරුණු ගොඩනැගීමත්, ආර්ථික දුප්පත් රටවල සංවර්ධනයට අදාළ විකල්ප (Development alternatives for the poor economic countries) තුළ ගැටලු මතුවීමත්, ආදී සාධක බලපාන ලද ආකාරය තවද ප්‍රවේශ තුළ සිට සාකච්ඡා කළ හැකි වේ. සමාජ ඉතිහාසය පිළිබඳව විශ්ලේෂණ ගොඩනගා ගැනීමේ දී ඒ තුළ පැහැදිලි වන ප්‍රබලතම ප්‍රවේශ බවට පරිවර්තනය වන්නේ දේශීය රාජ්‍ය සහ දේශීය පුද්ගල සහ සමාජ මනෝභාවාත්මක ස්වරූප වෙනස් කිරීමත්, ඒ මත පාරජාතික ආකල්ප ගොඩනැගීමත්, ඒ තුළින් දේශීය සමාජ ආර්ථික ආකෘතිකකරණ (Pristine economic and political models) ස්වරූපයනට වඩා පාරජාතික ස්වරූප පිළිගැනීම සහ එයට අනුගත වීමත්, ඒ තුළින් විදේශීය ආධිපත්‍යයික ආර්ථික සහ දේශපාලනික ආකෘතිකකරණයන් කෙරෙහි වඩාත් පෙළඹවීම් ඇති කිරීමත් තුළින් දේශීය ආර්ථික සහ සමාජ සම්ප්‍රදායන් බිඳවැටීමට අදාළ ප්‍රවේශ තුළ තවද අවදානම නිර්මාණය වූ ආකාරයත් ය (Albrow, 1996; Giddens, 1990; Robertson, 1992).

නවලිබරල්වාදයෙහි මූලික නියමයන් (Basic features of the neoliberalism) දේශීය රාජ්‍යාධිකාරයන් තුළ භාවිතයත් සමඟින් එහි බලය දේශීය වෙළෙඳපොළ උත්තේජන සඳහා ක්‍රමානුකූලවලව භාවිතා කරන ලද ආකාරයත්, ඒ තුළින් ගෝලීයදේශජකරණය (Glocalization) ගොඩනැගීමත්, දේශීය සමාජ ආර්ථික දේශපාලන ක්‍රියාවලියෙහි ප්‍රබල වෙනස්කම් ඒ තුළ නිර්මාණය වූ ආකාරයත් පැහැදිලි වේ. නවලිබරල්වාදය විශේෂයෙන්ම ධනවාදයෙහි සංවිධානගත ස්වරූප ගොඩනංවන අතර ඒ තුළ ධනවාදී ස්වරූප ආරක්ෂා කරන අයුරුත් (Protect capital(ism), එහිදී කම්කරුවන්ගේ බලය

සීමාසහිත කරන අයුරුත්, ඒ තුළ එම බලයෙහි ඒකරාශීකරණයට ඔවුන් තුළින්ම ඉඩ නොලැබෙන අයුරුත් දැකිය හැකි වේ.

මෙම දේශීය අභ්‍යන්තරික සමාජ ප්‍රවේශ තුළ ආර්ථික සහ දේශපාලනික පරිවර්තන ගොඩනැගීමට අදාළ ක්‍රියාවලි හුදෙක්ම බාහිර බලපෑම (External pressure) මත සිදුවන අයුරු පැහැදිලි වේ. මෙම දේශීය ශ්‍රම භාවිතය නිරන්තර මූල්‍ය ආකර්ෂණීය ප්‍රවේශ සහ සහාග බවට පත්වන අයුරුත්, ඒ ශ්‍රම බලය ප්‍රමුඛ කර්මාන්තකරුවන් සමගත් (Leading industrialists), වෙළඳාමෙහි නිරතවන වෙළෙන්දන් (Traders), නිර්යාතකරුවන් (Exporters), විශාල ඉඩම් හිමිකරුවන් (Big landowners), දේශීය දේශපාලන නායකයන් (Local political chieftains) සහ දේශපාලන බලකාරකයන් (Political proxies) සමගත් ආර්ථිකය කේන්ද්‍රීයව ව්‍යුහගතවන ආකාරයත් දැකිය හැකි ය. මධ්‍යගත රටවල් (Central countries) මගින් පරිධියේ රටවලට (Peripheral countries) ගලා එන ගෝලීය මතවාද (Global ideologies) හා වේගයෙන් දේශීය ශ්‍රම බලය අනුහුරු වෙමින් එම බලයෙහි අවශ්‍යතාව දේශීය සමාජ ප්‍රවේශ තුළට වේගයෙන් ගමන් කරන අයුරු දැකිය හැකි වුවත්, එහි බලාන්තර සබඳතාව (Power relations) නිරන්තර ගොඩනැගෙන්නේ ද ප්‍රධාන ශ්‍රම බලකායෙන් ව්‍යුක්තව මධ්‍යගත බලය සමඟ බවත්, ඒ තුළ වෘත්තීය සමාජ ඉල්ලීම් සහ ක්‍රියාවලීන් සඳහා ලැබෙන ඉඩ සීමාසහිත වන බව පමණක් නොව එම වෘත්තීය ඉල්ලීම් සහ ක්‍රියාවලීන් සඳහා ශ්‍රම බලකාය ප්‍රබල ලෙස සූදානම් නොවන බවත්, ඒ තුළ ඔවුනගේ ඉල්ලීම් ඉටු නොවීම සහ එහි සීමාන්තික ස්වරූප ගොඩනැගෙන බවත්, ඒ තුළ ශ්‍රම හිමිකරුවන් තම ආර්ථික සහ බල අරමුණු ශක්තිමත් කර ගනිමින් ප්‍රබල වන අයුරුත් පැහැදිලි කොට ගත හැකි ය.

මෙම බටහිර සංස්කෘතික සහ මතවාදාත්මක ව්‍යාප්තිය (Diffusion of this Western culture and ideology) තවදුරටත් නවලිබරල්වාදී වටිනාකම් (Neoliberal values) ගොඩනංවන අතර ඒ තුළ රාජ්‍ය සහ සිවිල් සමාජ ආයතන සඳහා විදේශ සහයෝගය (Foreign support for state and civil social institutions), විදේශ ආධාර (Foreign aids), ණය පහසුකම් සහ ඒවාට අදාළ ගෙවුම් ශේෂ පහසුකම් ප්‍රවර්ධනය කිරීම (Debt relief and balance for payments supports), රාජ්‍යතාන්ත්‍රික පීඩනය වැනි බලපෑම් සීමා සහිත කිරීම ද මේ තුළ ගොඩනැගීමත්, අවශ්‍ය වන විට මිලිටරි බලය යෙදවීමත් (Military intervention when necessary) සමග රාජ්‍ය පිළිබඳ හැඟීම තවද සීමා සහිත වන බවත් දැකිය හැකි වේ.

යුරෝපියානු ආර්ථික සහ දේශපාලන අනුකලනාත්මක ප්‍රවේශය මත ගොඩනැගෙන නවලිබරල්වාදී සාමස්ථිකාධිපත්‍යයික බලය (Power of hegemony of neoliberalism) බටහිර යුරෝපියානු නවලිබරල්වාදී ක්‍රමය (Western European-style of neoliberalism) යනුවෙන් ද හඳුන්වනු ලබන අතර එහි භූමිකාව සරල නොවන බවත්, එහි සංකීර්ණත්ව ප්‍රවේශ තුළ ප්‍රතිඵල ගොඩනැගෙන බවත් පැහැදිලි වේ. බ්‍රිතාන්‍ය අගමැතිනි මාග්‍රට් තැචර් (Margaret Hilda Thatcher, 1925 –2013, a British stateswoman and conservative politician who served as Prime Minister of the United Kingdom from 1979 to 1990 and leader of the Conservative Party from 1975 to 1990) සහ ඇමරිකානු ජනාධිපති රොනල්ඩ්

රේගන් (Ronald Wilson Reagan, 1911 – 2004, was an American politician and actor who served as the 40th president of the United States from 1981 to 1989) ඔවුන්ගේ රටවල පැවැති ප්‍රතිපත්ති අවබෝධ කරගත් අතර නවලිබරල් ප්‍රතිසංස්කරණ පිළිබඳවත් අවධානය යොමු කරමින් වොෂින්ටන් සම්මුතිය (The Washington Consensus) මත පදනම්ව ව්‍යුහාත්මක ගැලපුම් ප්‍රතිපත්ති (Structural adjustment policies) සහ කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරන ලද ආකාරය පැහැදිලි වේ. ඒ අනුව දැවැන්ත බදු කප්පාදුව (Massive tax cuts), වෘත්තීය සමිති බලය මැඩපැවැත්වීම (Crushing of power of trade unions), නියාමන ඉවත් කිරීම (Deregulation), පෞද්ගලීකරණය (Privatization) සහ පොදු සේවාවන්හි තරඟකාරිත්වය (Competition in public services) ආදී ප්‍රවේශ ක්‍රියාත්මක කිරීම දැකිය හැකි විය. ලෝක බැංකුව (World bank), ලෝක වෙළෙඳ සංවිධානය (World Trade Organization) ආදිය මූලික කොට ගනිමින් නවලිබරල් ප්‍රතිපත්ති ලෝකයේ බොහෝ රටවල් තුළ ක්‍රියාත්මක කිරීමට ප්‍රවේශ ගොඩනංවන ලදි. රොනල්ඩ් රේගන් සහ මාග්‍රට් තැචර් දැඩි කොමියුනිස්ට් විරෝධී ලෝක දැක්මක් ද ගොඩනගා ගන්නා ලද ආකාරය පැහැදිලිය. නවලිබරල්වාදය තුළ තැචර්වාදය සහ රොනල්ඩ් රේගන්ගේ ආර්ථිකක්‍රමවේදය (Thatcherism and Reaganomics) ප්‍රබල වූ බවත් එය යුරෝපීය සහ බටහිර පමණක් නොව ගෝලීය සමාජ ක්‍රමවේදයම ප්‍රබල හැරවුම් ලක්ෂයකට නිර්මාණය කරන ලද ආකාරයත් පැහැදිලි කොටගත හැකිය.

මෙම නවලිබරල් න්‍යායාත්මක සහ ඓතිහාසික ස්වරූප පිළිබඳ විමර්ශනයේ දී පැහැදිලි වන්නේ මෙහි ස්ථිතික (Statics) ලක්ෂණ නොමැති බවත්, මෙහි වෙනස වේගයෙන් සිදුවන බවත්, එම සිදුවන වෙනස නිරන්තර ආර්ථිකයට සහ බලයට අනුගත වන බවත්, එයට අනුකූල ලෙස සියලු මනෝභාවාත්මක සහ චර්යාත්මක ස්වරූප වෙනස් වන බවත්, එම වෙනස සමස්ථ පද්ධතියටම බලපාන බවත් ය. පසුගිය දශක හතරක කාලයත්, දෙවන ලෝක යුද්ධයෙන් පසු කාලය පිළිබඳ අවධානය යොමුකිරීමේ දීත්, පසුගිය දශක හතරක පමණ කාලය තුළ ගොඩනැගුණු ධනවාදී ආර්ථික ස්වරූප නවලිබරල්වාදී ස්වරූප ගත් බවත් පැහැදිලි වන අතරම, 1970 සහ 1980 දශක විශේෂයෙන් මධ්‍යගත රටවල් සහ පරිධියෙහි රටවල් (Centre and peripheral countries) අතර ආර්ථිකය සහ බලය පදනම් කරගෙන ගොඩනැගුණ සබඳතා තුළ මධ්‍ය ගත රටවල සිට පරිධියේ රටවල් දක්වා බලය සහ ආර්ථික සහ දේශපාලන මතවාදයන් වේගයෙන් විසරණය වූ අයුරුත් දැකිය හැකි විය.

කොමියුනිස්ට්වාදී ප්‍රතිපත්ති ප්‍රකාශනයට (Communist Manifesto) සහ දහනව වන සියවසෙහි මැද භාගයෙහි මාක්ස්වාදී ප්‍රකාශන නියමයනට අනුව ලෝක ආර්ථිකය සහ ගෝලීයකරණය (World economy and globalization) යන්න නව සංකල්පයක් හෝ නව ප්‍රවේශයක් නොවන බවත්, ගෝලීයකරණය තුළ ආර්ථිකය සහ බලය ව්‍යුහගතවන බවත්, එය වෙළඳපොල ආර්ථිකය හා ප්‍රබල වන බවත් පැහැදිලි කරයි. එමෙන්ම ලිබරල්වාදය යනු ධනේශ්වර පංතියෙහි ආර්ථික සහ දේශපාලන දර්ශනය බවත්, මෙම මාර්ක්ස්වාදී දෘෂ්ටියට අනුව පශ්චාද් ධනවාදය යනු තවද ධනවාදයෙහි උච්ඡතම අවස්ථාව බවත්, අන්තර් පාංතික ගැටුම් මේ තුළ ගොඩනැගෙන බවත් මෙම නියම තුළ පැහැදිලි කරයි. ව්‍යවහාරික

නවලිබරල්වාදය පිළිබඳව මාක්ස්වාදී විශ්ලේෂණ (Marxist analysis on applied neoliberalism) සැලකීමේ දී ලාභ අනුපාතය ඉහළ තත්ත්වයකට පත් කිරීම සඳහා රාජ්‍ය ක්‍රමවේදයෙහි මූලිකත්ව ගොඩනගන ආකාරයත් එහිදී පෞද්ගලිකකරණය, නීති සම්පාදනය, පොලිස් බලය සහ වෘත්තීය සමිති බලය ආදිය ඉලක්ක කරන ආකාරයත් පැහැදිලි කරයි.

මෙම ගෝලීයකරණ සහ නවලිබරල්වාදී ව්‍යුහ තුළ සමාජ, සංස්කෘතික, ආර්ථික, දේශපාලන සහ අනෙකුත් සියලු සමාජ සබඳතාවන්ගේ සීමා අතික්‍රමණය කරමින් පාරජාතික සමාජ අවකාශයන් (Transnational social spaces) සාර්ව සහ ක්ෂුද්‍රම (Macro and micro-level) ලෙස ගොඩනගා ඇති බවත් පැහැදිලි වේ.

මෙම සම්බන්ධතා ප්‍රබල සමාජ පරිවර්තන සඳහා හේතු කාරක වී ඇති බවත්, දේශසීමා සහ අන්තර් ක්‍රියාකාරීත්වය තුළ අන්තර්ජාතික සමාජ අවකාශයන් සඳහා ඉඩ විවර වී ඇති බවත් පැහැදිලි ය. මෙයට දශක හතරකට පමණ පෙර සමාජ ක්‍රමවේද තුළ ජාතික රාජ්‍ය දේශසීමා (Nation-states borders) අන්තර් ක්‍රියා ප්‍රබල නොවූ බවත්, දේශීය සහ එහි අභ්‍යන්තර සන්නිවේදනය සහ අන්තර් ක්‍රියාකාරීත්වය ප්‍රබල වූ බවත්, ඒ අනුව ජාතික රාජ්‍යය ප්‍රවේශය දේශීය හෙවත් අභ්‍යන්තර සමාජ අන්තර් ක්‍රියාකරණයට ප්‍රබල ලෙස බලපෑ බවත් පැහැදිලි ය (Zurn, 1998). යුරෝපීය ජාතික රාජ්‍ය අතර අනුකලනාත්මක බව (Integration between the states) ඉතිහාසය තුළ සිටම වර්තමානය දක්වාම යම් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක වශයෙන් ගොඩනැගෙනු දැකිය හැකි වන අතර එහිදී දේශපාලන සහ ආර්ථික සහයෝගීතාව ප්‍රබල වී ඇති බවත් පැහැදිලිය. යුරෝපීය ඉතිහාසය තුළ යුධ ගැටුම් ද තීව්‍ර වනු දැකිය හැකි වූ අතර එහිදී සියවසක යුද්ධය (Hundred Years' war from 1337 to 1453) සහ තිස්වසරක යුද්ධය (Thirty Years' war from 1618 to 1648) ප්‍රබල වූ බවත්, මෙම තිස්වසරක යුද්ධයෙහි අවසානයත් සමඟ ජාතික රාජ්‍ය සංකල්පයට අදාළ පදනම ගොඩනැගුණ බවත්, එය යුරෝපියානු ක්‍රමවේද තුළ ආරම්භ වන බවත් පැහැදිලි වේ.

අද්‍යතන ගෝලීයකරණ ප්‍රවේශය සහ එහි සක්‍රීය ස්වරූප මෙතෙක් නොවූ අන්තර් ක්‍රියා සහ අන්තර් සබඳතාකරණයකට (Interactions and inter-relations) සමාජ ව්‍යුහගත කොට ඇති ආකාරයත්, ඒ අනුව පුරවැසි ජීව ලෝකය පාර ජාතිකකරණයකට (Transnationalization of life-world of the citizens) හෝ අන්තර්ජාතිකකරණයට (Internationalization) ලක් වී ඇති බවත් දැකිය හැකි වේ. මෙම අන්තර් ජාතිකකරණය සහ ගෝලීයකරණය යන්න වෙනුවට අද්‍යතනයෙහි නවලිබරල්වාදය යන සංකල්පය පිළිබඳ සාකච්ඡා කරන බවත්, මෙම සංකල්පයන්හි අර්ථ, චර්යාත්මක ප්‍රවේශ සහ එළඹුම් එකිනෙකින් වෙනස් වන බවත් අපට පැහැදිලි කරගත හැකිය.

අද්‍යතන නවලිබරල්වාදය (Neoliberalism – Neo-liberalism) නූතන ලිබරල්වාදයෙන් (Modern liberalism) වෙනස් වන බවත්, මෙහි දෘෂ්ටිවාදාත්මක මූලයන් 19 වන සියවසෙහි වූ සම්භාව්‍ය ලිබරල්වාදය (Classical liberalism of the 19th century) හා සබැඳෙන බවත්, මෙම සම්භාව්‍ය

ලිබරල්වාදය රජයේ අධික බලයට (Excessive power of government) එරෙහිවත්, ආර්ථික ලිහිල්භාවය සහ පුද්ගලයන්ගේ නිදහස වෙනුවෙනුත් පෙනී සිටි බවත් පැහැදිලි ය (Smith, 2024). මෙම සම්භාව්‍ය ලිබරල්වාදය යන්න ලෝකය තුළ ප්‍රබල වූ දේශපාලන සහ ආර්ථික ක්‍රියාවලියක් කේන්ද්‍රීයව සමස්ත මානව සමාජයේ චර්යාත්මක, චින්තනමය ප්‍රවේශය මානවවාදය පදනම් කොටගත් ක්‍රියාවලියක් ලෙසට පත්කොට තිබූ අයුරුත්, එහි ඓතිහාසික සමාජ නියමයන් පිළිබඳව අධ්‍යයන කිරීමේ දී පැහැදිලි කරගත හැකි වේ.

19 වැනි සියවසෙහි අදහස් මත 20 වැනි සියවසෙහි අග භාගයෙහි දේශපාලනය නැවත මතුවීම හැඟවීමට භාවිතා කරන නවලිබරල්වාදයෙහි ප්‍රතිපත්ති ආකෘතිය නිරන්තර නියාමන ක්‍රමවේදයෙන් වියුක්ත දේශපාලන රාමුවක් (Deregulated political framework) තුළ නිදහස් වෙළෙඳපොළ ප්‍රතිපත්තියක් (Free market policy) අනුගමනය කරන ප්‍රබල චර්යාත්මක ක්‍රමවේදයක් බවට පත් වී තිබෙන අයුරුත්, මානව ප්‍රගතිය ගොඩනගා ගැනීමේ ප්‍රවේශයක් ලෙස තිරසාර ආර්ථික වර්ධනය පිළිබඳවත්, සම්පත් වඩාත් කාර්යක්ෂමව බෙදා හැරීම, ආර්ථික සහ සමාජ කටයුතු සඳහා අවම රාජ්‍ය මැදිහත්වීම අවධාරණය කිරීම සහ වෙළඳාමෙහි සහ ප්‍රාග්ධනයෙහි නිදහස සඳහා කැපවීම යනාදිය මූලික නියම බවට පත්කොට ගෙන ඇති අයුරුත් දැකිය හැකි වේ. එය අද්‍යතනයෙහි බටහිර සමාජයෙහි මූලධර්මයක් ලෙස ප්‍රමුඛ වී ඇති ආකාරය (Increasingly prominent as a doctrine in Western society) පමණක් නොව ගෝලීය සමාජ ප්‍රවේශය තුළ ප්‍රබල අන්තර්ගතයන් මේ වන විටත් නිර්මාණය කොට ඇති සමාජ මූලධර්මයක් (Social doctrine) බවට නවලිබරල්වාදය පත්ව තිබෙන අයුරුත් පැහැදිලි කොටගත හැකිය.

නවලිබරල්වාදයෙහි මූලාරම්භය (Origins of neoliberalism) පිළිබඳ ආර්ථික සහ දාර්ශනික විශ්ලේෂණ තුළින් (Economic and philosophical analysis) විද්‍යමාන තර්කනය වන්නේ එහි ආරම්භය ආර්ථික සහ සමාජ අධ්‍යයන ප්‍රවේශ (Economic and social studies) කේන්ද්‍රීයව ගොඩනැගුණු බවත්, ආර්ථික චින්තනයෙහි ඉතිහාසය තුළින් නවලිබරල්වාදී මූලාශ්‍ර සොයා ගත හැකි බවත්, නවලිබරල්වාදය සහ සම්භාව්‍ය ලිබරල්වාදය අතර වෙනස්කම් ගවේෂණය කළ හැකි බවත්, ඒ අනුව නවලිබරල්වාදය යන්න සම්භාව්‍ය ලිබරල්වාදයෙහි ස්වභාවික වර්ධනයක් නොවන බවත් (Not a natural development of the old classical liberalism) පැහැදිලි කරගත හැකි වේ. නවලිබරල්වාදය යන මෙම යෙදුම ප්‍රථම වරට ස්විට්ස්සර්ලන්ත ආර්ථික විද්‍යාඥ හාන්ස් හොනෙගර්ගේ ආර්ථික අදහස් පිළිබඳ ප්‍රවණතා (Swiss economist Hans Honegger’s Trends of Economic Ideas) (Plehwe, 2009, 10) හි සඳහන් වන අතර 1930 දශකයෙහි අවසානයෙන් පසුව දේශපාලන, ආර්ථික, බලය සහ සංස්කෘතික මූලධර්මයක් (Political, economic power and cultural doctrine) ලෙස මෙය ගොඩනැගුණු බවත් පැහැදිලි ය (Mirowski & Plehwe, 2009).

මෙම නවලිබරල්වාදය යන සංකල්පය දශක කිහිපයක සිට ලෝකය තුළ වඩාත් ප්‍රචලිත සහ ජනප්‍රිය ප්‍රවේශයක් බවට පත්ව තිබෙන බවත් (Springer, Birch, MacLeavy et.al., 2016), අද්‍යතනයෙහි මෙහි සමාජ භාවිතය හා සබැඳෙන තවද විශ්ලේෂණීය සංකල්ප දැකිය හැකි බවත්, ඒවා අතර මූලා

පරිපාලනවාදය (Monetarism), නවසම්ප්‍රදායානුගතවාදය (Neoconservatism), වෙළඳපොළ ප්‍රතිසංස්කරණය (Market reformation) යනාදිය වඩාත් ජනප්‍රිය වී ඇති බවත් පැහැදිලි වේ. දක්ෂිණාංශික සංවිධාන, එහි දේශපාලන පක්ෂ සහ චින්තන ප්‍රවේශ මෙම නවලිබරල්වාදී සංකල්ප සමාජ තුළ ස්ථාපිතකරණය සඳහා ප්‍රමුඛ වශයෙන් අනුබල දෙන බවත්, නවලිබරල්වාදය පුද්ගලීකරණය (Privatization), නියාමනය (Deregulation), ගෝලීයකරණය (Globalization), ඇතුළු ආර්ථික ලිබරල්කරණ ප්‍රතිපත්ති සමඟ ප්‍රබල ව්‍යුහගතකරණයන් ගොඩනංවන බවත්, ආර්ථිකයේ සහ සමාජය තුළ පුද්ගලික අංශයේ භූමිකාව ඉහළ නැංවීම මේ තුළ සිදුවන බවත්, ඒ සඳහා නිදහස් වෙළඳාම (Free trade), මූල්‍යවාදය (Monetarism), රජයේ වියදම් කප්පාදු කිරීම සහ අඩු කිරීම (Reductions of government spending) මෙන්ම තවද නවලිබරල් ආකෘතිකරණයට අදාළ ලෙස ආයතන සැලසුම් කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇති බවත්, ඒ අනුව එහි ප්‍රතිඵල ලෙස එම ආයතන ආර්ථික වශයෙන් පමණක් නොව දේශපාලනික ස්වභාවයක් ගනු ලබන බවත් අපට පැහැදිලි කර ගත හැකි වේ.

මේ අනුව නවලිබරල්වාදය යන්න සරල නොවන්නේ එහි දේශපාලනය සහ ආර්ථිකය යන දෙයාංශයම (Both politics and economics) ආවරණය කරන ප්‍රබල සැළසුම් ගත ආකෘතියක් නිසා බවත්, එය පෞද්ගලික ව්‍යවසායකත්වයට අනුග්‍රහය දක්වමින් ආර්ථික සාධක සහ එහි තත්ව රාජ්‍ය පාලනයෙන් පෞද්ගලික අංශයට (From the government to the private sector) පවරණ ප්‍රබල ආකෘතිකකරණයක් නිසා බවත්, මෙහි ප්‍රතිපත්ති සහ සැළසුම් නිදහස් වෙළෙඳපල ධනවාදයෙහි (Free market capitalism) ක්‍රියාකාරීත්වය සහ එහි කාර්යක්ෂමතාව කෙරෙහි සැළකිලි මත් වන බවත් පැහැදිලි කරගත හැකිය.

ඒ අනුව නවලිබරල්වාදය යනු ලෝකයෙහි තවද සම්භාව්‍ය ආර්ථික න්‍යායන් හි තවද අලෙවිකරණ හෝ ප්‍රචාරණ ප්‍රවේශයක් පමණක් නොවන බව මෙන්ම එය නව සම්භාව්‍ය ආර්ථික න්‍යායික ආකෘතික ගත කිරීමක් (Formation of neoclassical economics theory) ලෙස ද අපට හඳුනා ගත හැකිය. නවලිබරල්වාදය සහ එහි ආර්ථික සහ සමාජ ප්‍රභේද පිළිබඳ ආර්ථික විද්‍යාඥ ඇඩම් ස්මිත් (Adam Smith, 1723 –1790 - was a Scottish economist and philosopher) ගැඹුරු ලෙස සාකච්ඡා කොට ඇති අතර එහිදී වෙළෙඳපොළ යන්න නිරන්තර නොපෙනෙන ක්‍රියාකාරී බලවේගයන් (Invisible power) මගින් පාලනය කරන බවත්, එම නිසා වෙළෙඳපොළ අවම රජයේ මැදිහත්වීම්වලට යටත් විය යුතු බවත් පැහැදිලි කරයි. නමුත් ලිබරල්වාදය කාලයත් සමඟ විවිධ සම්ප්‍රදායන් (Number of different traditions) කේන්ද්‍රීයව විකාශනය වන බවත්, ඒ අනුව නූතන ලිබරල්වාදය වර්ධනය වන්නේම සමාජ-ලිබරල් සම්ප්‍රදායන් (Social-liberal tradition) කේන්ද්‍රීයව බවත්, නිරන්තර නිර්බාධවාදී ධනවාදය (Unfettered capitalism - not controlled or limited by anyone or anything) විසින් නිර්මාණය කරමින් උග්‍ර කරන ලද දරිද්‍රතාව සහ අසමානතාව (Poverty and inequality) වැනි ස්වරූප තවද සෘජු රාජ්‍ය මැදිහත්වීම් (Direct state intervention) මගින් වැඩි දියුණු වන බවත් මෙහිදී පැහැදිලි කොට ඇති අයුරු දැකිය හැකිය.

මෙම නවලිබරල්වාදී ප්‍රවේශය පිළිබඳව මැක්ස් වේබර් (Maximilian Karl Emil Weber, 1864 – 1920 - a German sociologist, jurist, historian, and political economist, and social scientist) පෙන්වා දෙන්නේ එය දේශපාලන නැඹුරු ක්‍රියාවලියක් (Political oriented process) බවත්, එහි බලය (Power) පිළිබඳ සංකල්පය ප්‍රබල වන බවත්, ඒ අනුව බලය වෙනුවෙන් බලපෑම් කිරීමට හෝ බලය අල්ලා ගැනීමට (Influence or seize power) සංවිධානය කරනු ලබන සමූහ සංවිධානගත ක්‍රියාවලියක් මෙහි අන්තර්ගත වන බවත් (Weber [1922] 1968) මේ තුළ තවද සාමූහික චින්තනමය ක්‍රියාවලියක් (Collective thought) ගොඩනැගෙන බවත් දැකිය හැකි බවයි (Mirowski, 2009; Dean, 2014). ඔහු තවද මේ තුළ ආර්ථික හැසිරීම් සංකල්පය පිළිබඳව ප්‍රධාන ලෙසම සාකච්ඡා කරන ලද අතර එහිදී ආර්ථික චර්යාව ද ප්‍රබල ලෙසම නවලිබරල්වාදී බවත් පෙන්වා දී තිබේ (Parson, 2003).

ධනවාදය විවිධ ආකාර ගත හැකි බවත්, දේශපාලන ධනවාදය (Political capitalism) සහ නූතන කාර්මික ධනවාදය (Modern industrial capitalism) අතර ප්‍රබල වෙනසක් ඇති බවත් මැක්ස් වේබර් පැහැදිලි කරයි. එමෙන්ම නූතන ධනවාදී ආර්ථිකය පෙර ආර්ථික ස්වරූපයනට වඩා වෙනස් බවත්, එහිදී ව්‍යාපාරික ස්වරූප නිවසින් වෙන් කොටගෙන තිබීමත් (Separation of businesses from the households), පුද්ගලික නොවන වෙළෙඳපොළ කේන්ද්‍රීයව මූල්‍ය ගනුදෙනු සිදුකිරීමත් (Monetary transactions through an impersonal market) වැටුප් ශ්‍රමය සූරා කෑමත් (Exploitation of wage labor), ලාභය කේන්ද්‍රීයව ප්‍රාග්ධනය ආයෝජන (Profit through capital investment) සඳහා අඛණ්ඩ උත්සාහයත් ප්‍රධාන ලෙස දැකිය හැකි වේ. නූතන ධනවාදයෙහි ප්‍රධාන අරමුණක් වන්නේ තාර්කික ගිණුම්කරණය කේන්ද්‍රීයව භාණ්ඩ නිෂ්පාදනය සහ සේවා සම්පාදනය මෙන්ම ව්‍යවසායකත්වය මගින් වාසි සහ සදාකාලික අලුත් කරණ ලද ප්‍රයෝජන ලුහුබැඳ යෑමක් බව ද වේබර් පැහැදිලි කරයි (Gerth & Wright Mills, 1961).

රාජේෂ් වෙනුගෝපාල් (Rajesh Venugopal) නව ලිබරල්වාදය යන්න ප්‍රබල මතභේදාත්මක තත්ත්ව නිර්මාණය කරන මෙන්ම එය සාහිත්‍යය තුළ පුළුල් ලෙස මේ වන විටත් ගොඩනැගී ඇති සංකල්පයක් ලෙසත් පැහැදිලි කරයි (Venugopal, 2015).

නවලිබරල්වාදීන් මහජන අයිතීන් (Liberal rights of the masses) ආරක්ෂා කිරීමේ අරමුණිනුත්, ආර්ථික සමෘද්ධිය ප්‍රවර්ධනය කිරීම (Promote economic prosperity) අරමුණු කරගෙනත්, නිරන්තර ලිබරල් අයිතීන් තහවුරු කරන නිදහස් වෙළඳපොල ආර්ථික ක්‍රමවේදය (Free-market economy) අනුමත කරනු ලබන ආකාරයත් පැහැදිලි වේ. නවලිබරල්වාදීන් (Neoliberals) ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවේශය පුළුල් ලෙස අවධාරණය කරන අතරම එහි ආරක්ෂාව පිළිබඳව ද තහවුරුව ගොඩනැංවීමට කටයුතු කරනු ලබන බව පැහැදිලි කරමින් මෙහි සුවිශේෂී ප්‍රවේශයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදයේ සීමාවන් (Limitations of democracy) පිළිබඳව ද කරුණු අවධාරණය කරමින්ම එහි අවශ්‍යතාවෙහි ප්‍රබල බව ද පෙන්වා දීමට කටයුතු කරන අයුරු දැකිය හැකි වේ.

එමෙන්ම, නවලිබරල්වාදය යන්න ආර්ථික මූලධර්මයක් (Economic doctrine) පමණක්ම නොවන බවත්, එය ක්‍රියාකාරී වෙළෙඳපොල හා ප්‍රබල ලෙස සම්බන්ධ වන බව පමණක් නොව ආර්ථික නොවන පූර්ව කොන්දේසි (Noneconomic preconditions) කෙරෙහි ද ප්‍රබල බලපෑම් සිදුකරන බවත් පැහැදිලි ය. ක්‍රියාකාරී වෙළෙඳපොළ (Functioning markets) නඩත්තුකරණය පිළිබඳ අත්‍යවශ්‍ය සාධක හඳුනාගැනීම ද නවලිබරල්වාදීන් විසින් සිදු කරන අයුරු දැකිය හැකි වේ. මේ පිළිබඳ බුද්ධිමය ව්‍යාපෘතිකකරණය (Intellectual projects) ද බොහෝදුරටම වෙළෙඳපොළ අනුපිළිවෙලට අදාළව සේවය කිරීම සඳහා නිවැරදි රාජ්‍යය (Right state) සහ නිවැරදි නීතිය (Right law) පිළිබඳ සාකච්ඡා ප්‍රවේශයක් ලෙසට ද අවධාරණය කිරීම දැකිය හැකි වේ (Biebricher, 2018).

නවලිබරල්වාදය දාර්ශනික මතවාදයක් බවට (As a philosophical doctrine) පරිවර්තනය වන විට එහි ක්‍රියාකාරී ප්‍රවේශ තුළ ආර්ථික මිනිසෙකු (Homo economicus) මානව සමාජ කාරක (Human social agents) බවට පත් කිරීමේ අදහස් (Ideas of human agents) එහි නොමැති බව ද පැහැදිලි වේ. එමෙන්ම ලිබරල්වාදීන් විශ්වාස කරන ලෙස මෙහි ආර්ථික ක්‍රියාවලීන් ඉක්මවා ගිය තවද සම්මත ප්‍රවේශ සහ එහි මානයන් ඇති බවට පෙන්වා දුන් මතද පැහැදිලි කොටගත හැකිය. මෙම ක්‍රියාකාරී සහ තරඟකාරී වෙළෙඳපොළට (Competitive markets) සදාචාරාත්මක සහ නෛතික පදනම් (Moral and legal foundations) සහිත වූ ප්‍රමාණාත්මක මූලධර්මයන්හි අවශ්‍යතාව ද මෙහි දාර්ශනික ව්‍යුහයන් තුළ ගැඹුරු මානයන් බවට පත් වී ඇති අයුරු ද දැකිය දැකිය හැකි වේ.

නවලිබරල්වාදීන් සහ අනෙකුත් සමාජීය පුද්ගලයින් නිරන්තර අවධානය යොමු කරන්නේ නවලිබරල් සමාජ අනෙකුත් කේන්ද්‍රීය වටිනාකම්වලට වඩා ලාභය ඉදිරියෙන් තබන බව පමණක් නොව නවලිබරල්වාදී වෙළෙඳපල හුවමාරුව (Market exchange) අනෙකුත් සියලු මානව සහ සමාජ ක්‍රියාවන්ට (Human action) මඟ පෙන්වීමක් ලෙස ගොඩ නැගෙන බවත්, සමාජයෙහි මින් පෙර පවා පැවැති සියලු සදාචාරාත්මක විශ්වාසයන් (Ethical beliefs) සඳහා ආදේශ කළ හැකි ආචාර ධර්ම එහි ඇති බවත් (Ethic in itself) ස්වකීය චින්තනමය ප්‍රවේශ තුළින් ඩේවිඩ් හාවි (David W. Harvey, Born in 1935 - is a British Marxist economic geographer, podcaster, and Professor of anthropology and geography) පෙන්වා දෙනවාක් මෙන්ම නවලිබරල්වාදය ලිබරල්වාදයෙන් වෙනස් හා වඩාත් සංකීර්ණ ඓතිහාසික සන්දර්භයක් තුළ අඛණ්ඩව පවත්වාගෙන යාමක් මෙන්ම එය වෙළෙඳපොලේ තර්කනය හෝ රාජ්‍ය බලය හෝ සීමා කිරීමක් ද නොවන බවත් පැහැදිලි කරයි (Harvey, 2005).

මේ අනුව නවලිබරල්වාදයෙහි නව ආකෘතික ගත කිරීම් 20 වන සියවසෙහි මැද භාගයෙහි වර්ධනය වෙමින් තිබූ ආර්ථික න්‍යාය තුළ ගැඹුරින් මුල්බැස ගෙන 20 වන සියවසෙහි අග භාගය වන විට එය මානව සමාජ ක්‍රියාවලිය තුළ ප්‍රබල වූ ක්‍රමවේදයක් බවට පත් වූ ආකාරය පමණක් නොව පත්වෙමින් පවතින ආකාරය ද දැකිය හැකි වන අතරම තවද සම්භාව්‍ය ලිබරල්වාදියෙහි සහ මාක්ස්වාදී සමාජවාදී

ප්‍රවේශයන්හි දේශපාලන සහ ආර්ථික ආකෘතික ගත කිරීම් හෙවත් දේශපාලන ආර්ථිකයන්හි වෙනස් කිරීම් මේ තුළ ප්‍රබලව විද්‍යමාන වන බැව් ද පැහැදිලි කරගත හැකි වේ (Schumpeter, 1954). මේ තුළ විද්‍යමාන තවද ප්‍රබල සංකල්පයක් වන්නේ එය ප්‍රබල සංස්කෘතිකවාදී මූලධර්මයක් (Most persuasive cultural doctrine) ලෙස පමණක් නොව ප්‍රායෝගික ලෙස නවලිබරල්වාදය සංස්කෘතික මානයන් (Cultural dimension of neoliberalism) ගොඩනංවන ප්‍රවේශයක් ලෙස ද විසි එක් වන සියවසෙහි ක්‍රියාකාරී සමාජ ප්‍රවේශ තුළින් කැපීපෙනෙන ලෙස හඳුනාගත හැකි වීමයි (Mirowski, 2013).

ඒ අනුව නවලිබරල්වාදය යන්න ප්‍රමාද ධනවාදයේ සදාචාරාත්මක දූර්වලතා (Ethical weakness) නියෝජනය නොකරන බැව් මෙන්ම එය එක් අතකින් ඒකීය දෘෂ්ටිවාදයක් නියෝජනය නොකරන බැව් ද පැහැදිලි වේ. එය මානව විද්‍යාත්මක දෘෂ්ටි ගතික බව කෙරෙහි අවධානය යොමු කරන අතරම වැඩිවන පාලනය සහ ආර්ථික කළමනාකරණය රාජ්‍ය ක්ෂේත්‍ර තුළින් විස්ථාපනය කිරීම මෙන්ම බටහිර සමාජ සංකීර්ණත්වයට (Complexity of Western society) අනුගත ලෙස කාර්යක්ෂමතා හැඩගැස්වීම ද දැකිය හැකිය. නවලිබරල්වාදය යන්න ප්‍රබල දෘෂ්ටිවාදී ගතික (Ideological dynamics) නියෝජනය කරන අතර එය ගෝලීය ධනේශ්වර ක්‍රමයෙහි (Capitalistic system of the global scale) පැවති ප්‍රධාන තරඟකරුවාගේ 1990 වසරෙහි බිඳවැටීමත් සමඟ ගෝලීය ධනේශ්වර ක්‍රමයෙහි ප්‍රබල පරිණාමයට ද හේතු වූ අයුරුත් දැකිය හැකි වේ.

නවලිබරල්වාදයෙහි ආරම්භය (Genesis of neoliberalism) සම්බන්ධව මිචෙල් ෆූකෝල්ට් (Paul Michel Foucault, 1926 – 1984 - a French philosopher, historian of ideas, writer, political activist, and literary critic) විසින් ප්‍රංශයේ විද්‍යාලයක දේශනයක් අතරතුර දී ඉදිරිපත් කරන ලද ප්‍රබලතම සංකල්පයක් ලෙස Biopolitics යන්න හඳුනා ගත හැකි වන අතර (Foucault, 2008) එමගින් මිනිසා තාර්කික නියෝජිතයින් ලෙස ගොඩ නැගෙන්නේ කෙසේද (How human beings behave as rational agents) යන්න පිළිබඳව ස්වභාවික විවරණයක් ඉදිරිපත් කෙරෙන අතර එහිදී තවද සම්භාව්‍ය ආර්ථික විද්‍යා න්‍යායවේදීන් (Neoclassical economics) පැහැදිලි කරන්නේ සංස්කෘතික රාමුගත කිරීම් (Cultural frameworks) සහ සංවිධාන සහ ආයතනගත කිරීම් (Institutions and organizations) තුළින් තාර්කික චර්යා පද්ධති සහ තාර්කික තෝරාගැනීම් (Rational choices) මූලික ප්‍රවේශ බවට මානව එළඹුම් කාරක කේන්ද්‍රීයව සිදු බවයි.

මිචෙල් ෆූකෝල්ට් විසින් පශ්චාද් ව්‍යුහවාදී විශ්ලේෂණ (Post-structuralist analysis) කේන්ද්‍ර කොට ගනිමින් නවලිබරල්වාදය පිළිබඳව ද විශ්ලේෂණ කරන අතර එහිදී ව්‍යවසාය සහ කාර්ය සාධනය මූලික කොට ගනිමින් සමාජ සහ පෞද්ගලික ජීවිතය මුළුමනින්ම ප්‍රතිනිර්මාණය කිරීමට මෙම තත්ව උත්සාහ ගන්නා බව ද පැහැදිලි කරයි. එහිදී තරඟකාරීත්වය (Competitiveness) ආචාර ධර්ම වටිනාකම් (Ethical worth) සංස්කෘතිය, අධ්‍යාපනය, පුද්ගල සබඳතා සහ පුද්ගල ස්වයං දිශානතීන් විනිවිද යමින් අසමානතාවන්, සදාචාරාත්මක වටිනාකම් සහ ආසාවන් පිළිබඳ මූලික දර්ශනයක් බවට ද මෙය පත් කර

ගන්නා බවත්, ආයතනවලට තමන්ව ප්‍රතිනිර්මාණය කර ගැනීමට සහ නියෝජිතායතනයේ මෙම දැක්මට අනුව තමන්ව මැන බැලීමට තරඟකාරී ලෙස වෙහෙසීමට දිරිගන්වන බවත්, ජයග්‍රාහකයන් සහ පරාජිතයින් නිර්මාණය කරන ආකාරයත් තවද ඔහු පැහැදිලි කරන අයුරු දැකිය හැකිය.

නවලිබරල් කතිකාව පිළිබඳ ගොඩනගන සාකච්ඡා නිරන්තර නිදහස් විෂය ක්ෂේත්‍ර සහ සමගාමී වන බව මේ පිළිබඳ මිචෙල් ෆූකෝල්ට්ගේ පුනරුච්චාරණ තුළින් පැහැදිලි වේ. දෘෂ්ටිවාද විවේචනය පිළිබඳ එළඹුම් මාක්ස්වාදී දේශපාලන සම්ප්‍රදාය තුළ දැකිය හැකිවාක් මෙන්ම, දෘෂ්ටිවාදී උපකරණ තුළ සැඟවුණු ආර්ථික ව්‍යුහ පිළිබඳ මිචෙල් ෆූකෝල්ට්ගේ විවේචන (Criticisms of Michel Foucault on the economic structures) ගොඩනැගෙන අයුරු ද අපට පැහැදිලි කොට ගත හැකි වේ. තවද, ආර්ථික ක්ෂේත්‍රය විසින් ජීවන ලෝකය යටත් විජිතකරණය කිරීමේ ස්වරූප දෘෂ්ටිවාදී කරගෙන මිචෙල් ෆූකෝල්ට් කිසිවිටෙක නවලිබරල්වාදය වෙත ළඟා නොවීම ද සුවිශේෂී වේ. එසේම පශ්චාද් කාර්මික සහ තාක්ෂණික ප්‍රවේශ වෙනස් විය යුතුය යන සංකල්පීය ස්වරූප තුළ තවද Biopolitics යන්න පිළිබඳ Foucauldian සංකල්ප ද සම්බන්ධ කොට ඇති බව දැකිය හැකි වේ. විශේෂයෙන් මෙහිදී දැනුම (Knowledge) සහ බලය (Power) නිරන්තර බැඳෙන බව ඔහු පැහැදිලි කරයි. මේ අනුව මාක්ස්වාදී සම්ප්‍රදාය (Marxian tradition) සහ මිචෙල් ෆූකෝල්ට්ගේ දර්ශනය (Foucault’s philosophy) අතර ඇති න්‍යායික දූරස්ථභාවයක් ද පැහැදිලි නොවනු ඇත. මිචෙල් ෆූකෝල්ට්ගේ පාඨයන් සරලව සහ තවද සාවධානව කියවීම මගින් කෙනෙකුට නවලිබරල්වාදයේ දේශපාලන වැදගත්කම (Political significance of neoliberalism) පිළිබඳ ඔහුගේ ආකල්පය ඉතා නිවැරදි ලෙස පැහැදිලි කොටගත හැකි වේ (Gordon, 1991).

මිචෙල් ෆූකෝල්ට් පැහැදිලි කරන්නේ මෑත කාලීන නවලිබරල්වාදය, රාජ්‍ය කලාව (Art of government) ආදිය යන්න පිළිබඳ නව සංකල්ප ලෙස වටහා ගැනීම සැලකිය යුතු තරම් අභියෝගාත්මක සංසිද්ධියක් (Challenging phenomenon) වන බවයි (Gordon, 1991). රාජ්‍ය සමාජවාදයේ අභාවයෙන් පසු (Demise of state socialism) මතුවන නවලිබරල්වාදයෙහි ප්‍රතිපත්තිමය ආකෘතිය හෝ ආයතනික සැකිල්ල (Policy paradigm or institutional template) පමණක් නොව අභ්‍යන්තරික සහ බාහිර ප්‍රවේශ බල ජාල කේන්ද්‍රීයත්වයෙහි (Centrism of network of power) ආත්මීය ස්වරූප තුළින් ක්‍රියාත්මක වන බව ෆූකෝල්ඩියන් අන්තර් දෘෂ්ටිකරණය තුළ (Foucauldian insight) හඳුනාගත හැකි අතරම රාජ්‍යය, මහ බැංකු සහ අනෙකුත් බහුපාර්ශ්වික නියෝජිතායතනවල තාක්ෂණික, සදාචාරාත්මක සහ සමාජීය ජීවන රටා මත එහි ප්‍රතිපත්ති සම්මුතීනගේ මාරුකරණය තුළ තවද ක්‍රියාත්මක වන බව ද පැහැදිලිය.

මේ අනුව, අද්‍යතන සමකාලීන සමාජ (Contemporary societies) කෙරෙහි බලපාන නවලිබරල් කතිකාව (Neoliberal discourse) විසින් ක්‍රියාකරන බලය යන්න එක් අතකින් යටත් වීමේ ක්‍රමවේදයක් හෝ ඒ හා සම්බන්ධිත ප්‍රවේශයක් හෝ නොවන බවට ද පැහැදිලි කරගත හැකිය. එය සෑම විටම වක්‍රාකාරී ලෙස ක්‍රියාත්මක වන බල ආකෘතිකකරණයක් (Coercive power) බව ද පැහැදිලිය. බොහෝ දුරටම නිදහස යන්න පිළිබඳව ප්‍රශ්න නොකරන විෂයයන් මත වක්‍රව ක්‍රියා කරන බල ආකාරයක් බව ද පැහැදිලි

වේ. නවලිබරල්වාදය විසින් සියලුම ජෛව දේශපාලන මැදිහත්වීම්වල (Biopolitical interventions) ඉලක්ක මේ හා සමගාමී බවට පත් කොට ගෙන ඇති අයුරු ද පැහැදිලිය.

විලියම් ඩේවිස් (William Davies, born 1976 - is an English writer, political and sociological theorist) නවලිබරල්වාදය පිළිබඳ නිර්වචනය කරන්නේ හුදෙක්ම ආර්ථිකය කේන්ද්‍රීයව ගොඩනැගෙන දේශපාලන මූලාවන්ගෙන් ලුහු බැඳීමෙන් මිදීමක් ලෙසයි (Davies, 2014). තනි පුද්ගල යෝජනයෙහි අවකාශ සීමා කරන අතිවිශාල තාක්ෂණික ක්‍රියාමාර්ග ප්‍රදර්ශනය (Displaying a vast array of technical measures) කරන ස්වකීය සදාචාරාත්මක සහ මානව විද්‍යාත්මක පූර්ව නිගමනයන් (Ethical and anthropological presuppositions) සඟවා ගන්නා ආණ්ඩු කලාවක බලපෑම් පෙන්නුම් කරන බව සඳහන් කළ හැකිය. එහෙත් මෙම නවලිබරල් දේශපාලන වැඩපිළිවෙළ පමණක් නොව රජය පිළිබඳ අදහස ද ඉස්මතු කිරීම එතරම් සංකීර්ණ නොවන බව ද ඔහු පැහැදිලි කරයි.

මේ අනුව මෙම නවලිබරල් ආර්ථික න්‍යායන් කිසිදු දේශපාලන වැදගත්කමක් නැති වූවක් ලෙස සැලකිය හැකි නම් ඒ කුමන අර්ථයෙන් දැයි බැලීම ද දුෂ්කර ය. එමෙන්ම බොහෝ දුරටම මෙතෙක් මේ පිළිබඳව ගොඩනැගී ඇති අවිද්‍යාත්මක අදහස් කේන්ද්‍රීයව නැගුණ රූපක අත්හැරීමට කාලය පැමිණ තිබේ. නවලිබරල්වාදය, නව සම්භාව්‍ය ආර්ථික විද්‍යාවේ කේන්ද්‍රස්ථානයක් ලෙසත්, ඒ තුළ රාජ්‍යය උපකරණ පද්ධතික ජාලයක් (Network of governmental apparatuses) නිර්මාණය වන බවත්, එම පද්ධතික ක්‍රමවේදය නොසඟවන ක්‍රියාවලියක් ගොඩනගන බවත්, ඒ පිළිබඳ පැහැදිලි අවබෝධය මැකියාවේලියානු දර්ශනයට (Machiavellian sense of the term) අනුකූලව අත්‍යවශ්‍ය වන බවත් පැහැදිලිය. එසේම නවලිබරල්වාදය රඳා පවතින ආර්ථික න්‍යාය තුළ කුමන දේශපාලන ගැටලු (Political problems) තිබුණත් ඒ සඳහා විසඳුම් ඇතුළත් කිරීමට එය සමත් වන බැව් ද පැහැදිලිය. මේ පිළිබඳව විලියම් ඩේවිස් පවසන පරිදි ආර්ථික, දේශපාලන සහ සමාජ වෙන් කරන ලිබරල් සීමාවන් සියලු වසම්වලට කළමනාකරණය, දේශපාලනීකලනය විහිදුවන ජාල සහ මෙවලම් පැහැදිලිවම නවලිබරල් නිර්මාණය මගින් විසුරුවා හරිනු ලැබුවහොත් (Davies, 2014), එවිට අපට අවශ්‍ය වන්නේ සංවිධානවල දේශපාලන ස්වභාවය පිළිබඳ නව අවබෝධයක් ගොඩනගා ගැනීම බව ඔහු පැහැදිලි කරයි.

## නවලිබරල්වාදී මහජන කළමනාකරණය සහ එහි රාජ්‍ය එළඹුම:

නවලිබරල්වාදය මහජන නව කළමනාකරණීය ප්‍රවේශ (Public new management approaches) කේන්ද්‍රීයව ගොඩනැගෙන අතර එහිදී රාජ්‍ය සංවිධානයෙහි ප්‍රධාන අරමුණු (Main government objectives) රාශියක් දැකිය හැකි වන අතර ඒවා කේන්ද්‍රීයව පහත සඳහන් කරුණු ප්‍රධාන කොට ගත හැකි වේ. ඒවා අතර

1. මහජන උත්ප්‍රේරක රාජ්‍යකරණ එළඹුම් - (Catalytic government approaches)

2. ප්‍රජාව සතු රාජ්‍යකරණය - (Community owned government) - බලගැන්වීම වෙනුවට සේවය අරමුණු කර ගැනීම
3. තරඟකාරී රාජ්‍ය ප්‍රවේශය - (Competitive government approach) - තරඟකාරී සේවාමයකරණය
4. පරමාර්ථ අරමුණු කරගත් රාජ්‍ය ක්‍රමවේද - (Mission driven government methods)
5. ප්‍රතිඵල නැඹුරු කොටගත් රාජ්‍ය - (Results oriented government)
6. පාරිභෝගිකත්වය මෙහෙයවන රාජ්‍ය - (Customer driven government) - නිලධාරිවාදය නොව (Not the bureaucracy) පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම
7. ව්‍යවසායකත්ව රාජ්‍ය - (Enterprising government) වියදමට වඩා ඉපයීම් ක්‍රම කේන්ද්‍රීය වූ ප්‍රවේශ
8. පූර්වාපේක්ෂණ රාජ්‍ය - (Anticipatory government)
9. විමධ්‍යගත ප්‍රවේශ කේන්ද්‍රීය වූ රාජ්‍ය - (Decentralized government) ඉහළ ධූරාවලියේ සිට සහභාගිත්ව කළමනාකරණීය ප්‍රවේශ සහ කණ්ඩායම් වැඩ අරමුණු කොට ගැනීම
10. වෙළෙඳපොළ නැඹුරු රාජ්‍ය - (Market-oriented government) - වෙළඳපළ මගින් වෙනස්කම් උත්තේජනය කිරීම

යනාදී වශයෙනි (David & Gaebler, 1992, P. 145, 6).

මෙම නවලිබරල් රාජ්‍යත්වය (Neoliberal governmentality) සහ එහි පදනම පිළිබඳව අවධානය යොමු කිරීමේ දී 1990 දශකයෙහි ඇමරිකාවෙහි රාජ්‍ය කළමනාකරණ මූලධර්ම භාවිත කළ ආකාරය හඳුනා ගත හැකි අතරම එහිදීම විශේෂයෙන් විවිධ රාජ්‍ය ආයතන ජාතික කාර්ය සාධන පිළිබඳ සමාලෝචනයකට (National performance review) ලක් කොට තිබූ ආකාරයත්, එහි ප්‍රධානතම අරමුණු ලෙස සංවර්ධනය සඳහා වගවීම (Accountability) පමණක් නොව ඵලදායිතාව ඉහළ නැංවීමේ ප්‍රවේශත්, රාජ්‍ය නාස්තිය නැති කිරීම සහ පරිපාලනයෙහි කාර්යක්ෂමතාව මෙන්ම සමාජ සක්‍රීය කිරීමේ ප්‍රවේශත් (Increase administrative and social efficiency), මෙහි ප්‍රධාන අරමුණු වූ බව පැහැදිලි කොටගත හැකි වේ (Steger & Ravi, 2010).

නවලිබරල්වාදී ප්‍රත්‍යක්ෂකරණය කේන්ද්‍රීයව මහජන ප්‍රතිපත්ති සංයුතිකකරණයෙහි (Concrete set of public policies) ස්වරූප හඳුනාගත හැකි අතර එය තවද පහත සඳහන් ලෙස සාකච්ඡා කළ හැකි වේ. එනම්

1. ආර්ථිකය සහ ඒ පිළිබඳ පාලන රීති සහ සීමා ඉවත් කිරීම - (Deregulation of the economy)
2. වෙළඳාම සහ කර්මාන්ත පිළිබඳ නිදහස්කරණ හෙවත් ලිබරල් ප්‍රතිපත්ති සහ සැලසුම් - (Liberalization of trade and industry)
3. රජයට අයත් ව්‍යවසායන්හි පෞද්ගලිකකරණ ප්‍රවේශ (Privatization of state-owned

enterprises)

යනුවෙන් පැහැදිලි කොටගත හැකිය (Steger & Ravi, 2010).

මෙම නවලිබරල්වාදී රාජ්‍යය ආකෘතිකරණය තුළ ගොඩනැගෙන දෘෂ්ටිවාදී සහ ප්‍රතිපත්තිමය මානයන්හි සක්‍රීයත්වයෙහි තවද චර්යාත්මක කරුණු රාශියක් හඳුනාගත හැකි අතර ඒවා ගෝලීය දේශපාලන සහ බලය මෙන්ම ආර්ථික (Global politics, power, and economy) ප්‍රවේශය හා සම්බන්ධ වන බවත්, ගෝලීය යුරෝපීය සහ බටහිර බල අධිකාරිත්වයෙහි කලාපීය මෙන්ම පරිධියෙහි සමාජ ප්‍රවේශයන් හා බලපෑම් ස්වරූප ලෙස මෙම තත්ව ව්‍යුහගත වන අයුරුත් අද්‍යතන රාජ්‍ය සහ සමාජ පැවැත්මෙහි ස්වරූප කේන්ද්‍රීයව අවබෝධ කර ගත හැකි අතර ඒ සඳහා තවද කරුණු රාශියක් කෙරෙහි අවධානය යොමු කළ හැකි බව ද පර්යේෂණ ප්‍රවේශ තුළින් අපට පැහැදිලි කොටගත හැකි වේ. ඒවා අතර

- ගෝලීය මූල්‍ය සහ වෙළෙඳ ප්‍රවාහ මත සිට එහි පාලන ස්වරූප ලිහිල් කිරීම සහ ඉවත් කිරීම මෙන්ම ජාතික ආර්ථිකයන්හි කලාපීයකරණය සහ ගෝලීය ඒකාබද්ධතාකරණය ගොඩනැංවීම
- විරැකියාව වැඩිවීමේ අවදානමක් තිබියදීත් ස්වාධීන සහ මහ බැංකු පොලී අනුපාත වෙනස් කිරීම සහ පොලී අනුපාත භාවිතයෙහි ස්වරූප නිර්මාණය කිරීම මෙන්ම, උද්ධමනයෙහි ස්වරූප ද ඒ තුළින් පාලනය කිරීමට උත්සාහ දැරීම
- ව්‍යාපාර සහ ඉහළම ආදායම් ලබන්නන් සඳහා බදු ඇතුළත් කිරීමේ සහ අදාළ ව්‍යාපෘතිකරණය
- නම් කරන ලද ආර්ථික කලාපයන්හි ආයෝජන ප්‍රවේශ සඳහා දේශීය සහ විදේශීය සංස්ථා සහ මණ්ඩලයන්ට බදු සහන ලබාදීම
- සමාජ සේවාවන් සහ සුබසාධන කටයුතු අවම කිරීමට උත්සාහ ගැනීම
- වෙළඳපළ අවශ්‍යතාවන් හා සම්බන්ධිත වාණිජ ප්‍රවේශ සහ නාගරික ප්‍රජාවගේ සැළසුම්කරණයන් නිර්මාණය කිරීම
- නව ලිබරල්වාදී සුසමාදර්ශයන් ගොඩනැංවීම සහ ප්‍රතිනිෂ්පාදන කාර්ය සඳහා දේශපාලනික ආයතන නිර්මාණකරණය මෙන්ම තවද චින්තන සංවිධාන නිර්මාණය කිරීම සහ ඒවා පවත්වාගෙන යාමට අදාළ කටයුතු සිදු කිරීම
- ගෝලීය දෘෂ්ටිවාදී බලයෙහි පිළිබිඹුකරණය

යනාදිය තවද සුවිශේෂී කරුණු ලෙස සැලකිය හැකි වේ (Steger & Ravi, 2010).

බොහෝ නිර්වචනවලට අනුව, නවලිබරල්වාදය යනුවෙන් අදහස් කරන්නේ සමාජය තුළ වෙළෙඳපොළ යාන්ත්‍රණය සහ තරඟකාරීත්වය පුළුල් කිරීමට සහ බලාත්මක කිරීමට රාජ්‍ය බලතල භාවිතා කිරීම බවත් පැහැදිලිය. මේ අනුව 1970 දශකයෙහි සිට නවලිබරල් අදහස් සහ ප්‍රතිසංස්කරණවල ජයග්‍රහණ දැකිය හැකි අතර වෙළෙඳපොළ ආරක්ෂාව, මහ බැංකු සහ වෙළෙඳ සංවිධාන ඇතුළු බොහෝ ආයතන

විශාල තාක්ෂණික නියෝජ්‍යත්වය සහ බහුපාර්ශ්වික ආයතන (Technocratic agencies and multilateral institutions) යටතේ පවතින බව ද පැහැදිලිය (Gane, 2015).

## නවලිබරල්වාදය සහ එහි ආසියානු ප්‍රවේශය:

නව ලිබරල්වාදයෙහි පළමු සහ දෙවන රැල්ලෙහි (First and second wave of the neoliberalism) ආසියාව සහ එහි සමාජ ක්‍රමවේදය කෙරෙහි සිදු කරන ලද බලපෑම සරල නොවූ බවත්, ලිබරල්වාදයෙහි වෙළෙඳපොළ අදහස්කරණය (Market oriented ideas of liberalization), නියාමනය සහ පෞද්ගලිකකරණය (Deregulation and privatization) ආදියට රාජ්‍ය මැදිහත්වාදයෙහි (State interventionism) සහ ආර්ථික මධ්‍යගතවාදයේ (Economic centralism) ප්‍රබල සම්ප්‍රදායන් (Strong traditions) සමඟ සටන් කිරීමට සිදු වූ බවත් පැහැදිලි වේ. මෙම කලාපය තුළ රාජ්‍ය සහ පෞද්ගලික අංශය අතර බැඳීම් පමණක් නොව පුද්ගලයා සහ රාජ්‍ය අතර බැඳීම් ද ප්‍රබල වූ බවත්, මෙම ස්වරූප බොහෝ දුරට ලේඛනගත කර ඇති ආකාරයත් අපට පැහැදිලි කර ගත හැකි වේ.

1960 දශකයෙහි මැද සිට 1990 පමණ දක්වාම කාලය තුළ ආසියානු රටවල් (Asian countries) අටක ප්‍රබල දියුණුවක් ගොඩනැගී ඇති බවත්, එම රටවල් අතරට ජපානය (Japan), හොංකොං (Hong Kong), දකුණු කොරියාව (South Korea), සිංගප්පූරුව (Singapore) සහ තායිවානය (Taiwan) අයත් වන බවත්, අලුතින් කාර්මීකරණය වූ රටවල් අතර ඉන්දුනීසියාව (Indonesia), මැලේසියාව (Malesia) සහ තායිලන්තය (Thailand) අයත් වන බවත්, කලාපයේ සෙසු රටවල් වලට වඩා දෙගුණයක් එම රටවල් වර්ධනය වී ඇති බවත්, ලතින් ඇමරිකාව (Latin America) සහ දකුණු ආසියාවේ (South Asia) වර්ධන වේගය මෙන් තුන් ගුණයක් සහ උප-සහරාන් අප්‍රිකාවේ (Sub-Saharan Africa, Subsahara, or Non-Mediterranean Africa) වර්ධන වේගය මෙන් පස් ගුණයක් පමණ මෙම රටවල් වර්ධනය වී ඇති බවත්, 1993 වසරෙහි ලෝක බැංකු වාර්තාව (The World Bank report) අවධාරණය කරන ආකාරය ද පැහැදිලි වේ. එසේ වුවත් ආසියානු සංවර්ධන ආකෘතිය ( Asian Development Model) කේන්ද්‍රීයව ආසියාවේ (Asia) ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් සඳහා දේශීය සමාජ සහ සංස්කෘතික රාමු තුළ සමීප ක්‍රමවේද සහ රාජ්‍ය ව්‍යාපාරික සහයෝගීතාව ප්‍රබල මාර්ග ලෙස පරිවර්තනය වී තිබුණු බව ද අපට පැහැදිලි කරගත හැකි වේ.

**References:**


Albrow, M. (1996). *The global age: state and society beyond modernity*. Cambridge: Polity Press.

Biebricher, Thomas, (2018). *The Political Theory of Neoliberalism*. Stanford, CA: Stanford University Press.

Davies, W. (2014). *The Limits of Neoliberalism: Authority, Sovereignty and the Logic of Competition.* London: Sage.

David Osborne and Ted Gaebler, (1992). *Reinventing Government.* cited in Robert B. Denhardt, *Theories of Public Organization.* (5th ed.), Boston, Mass: Wadsworth/Cengage Learning, pp. 145, 6.

Dean, M. (2014). Rethinking Neoliberalism, *Journal of Sociology*, Vol. 50:2, pp. 150 –163.

Foucault, M. (2008). *The Birth of Biopolitics: Lectures at the Collège de France, 1978–1979.*Basingstoke, UK, New York: Palgrave Macmillan.

Gane, N. (2015). Central banking, technocratic governance, and the financial crisis: Placing quantitative easing into question. *Sosiologia* 15: 381–396.

Gerth, H. H. and C. Wright Mills, (1961). *From Max Weber.* London: Routledge.

Giddens, A. (1990). *The consequences of modernity*, Stanford. CA: University Press.

Gordon, C. (1991). Government Rationality: an Introduction, in Burchell, G., Gordon, C. and Miller, P. (Eds) *The Foucault Effect. Studies in Governmentality*. Chicago: The University of Chicago Press.

Harvey, D. (2005). *A Brief History of Neoliberalism.* Oxford: Oxford University Press.

Mirowski, P. (2009). 'Postface', in Mirowski, P. and Plehwe, D. (Eds) *The Road from Mont Pèlerin: the Making of the Neoliberal Thought Collective.* Cambridge, MA: Harvard University Press, pp. 417–455.

Mirowski, P. (2013). *Never Let A Serious Crisis Go to Waste: How Neoliberalism Survived the Financial Meltdown.* London: Verso.

Mirowski, P. and Plehwe, D. (Eds) (2009). *The Road from Mont Pèlerin: the Making of the Neoliberal Thought Collective*. Cambridge, MA: Harvard University Press.

Parsons, S. D. (2003). *Money, time and rationality in Max Weber – Austrian connections*. London: Routledge.

Plehwe, D. (2009). 'Introduction' in Mirowski, P. and Plehwe, D. (Eds) *The Road from Mont Pélerin: the Making of the Neoliberal Thought Collective*. Cambridge, MA: Harvard University Press, pp. 1–42.

Robertson, R. (1992). *Globalization: social theory and global culture,* London: Sage.

Schumpeter, J. (1954). *History of Economic Analysis.* Oxford: Oxford University Press.

Steger, Manfred and Ravi Roy, (2010). *Neoliberalism: A Very Short Introduction*, New York: Oxford University Press.

Smith, N. (2024, March 30). *neoliberalism*. *Encyclopedia Britannica*. Retrieved from https://www.britannica.com/money/neoliberalism

*Springer, Simon; Birch, Kean; MacLeavy, Julie, eds., (2016). The Handbook of Neoliberalism. Routledge.*

Venugopal, Rajesh, (2015). “Neoliberalism as Concept”, *Economy and Society*, 44(2): 165–187.

Zurn, M. (1998). Regieren jenseits des Nationalstaats, Frankfurt am Main: Suhrkamp.